**ශීර්ෂය 422 - දහම් පාසල්,පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පුනරාවර්තන හා මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අමාත්‍යාංශයේ වැඩසටහන් අනුව වියදම් සාරාංශයෙහි (ACA 2 ආකෘතිය) වැඩසටහන 2 හි පුනරාවර්තන වියදම රු. 4,605,855,630 ක් හා ප්‍රාග්ධන වියදම රු. 193,584,237 ක් ලෙස සඳහන් කර තිබුණද වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනයෙහි (ACA 2 i) එම වියදම් පිළිවෙලින් රු. 4,635,855,630 ක් හා රු. 163,584,237 ක් ලෙස සඳහන් කිරීම හේතුවෙන් වැඩසටහන 2 හි පුනරාවර්තන හා ප්‍රාග්ධන මුළු වියදම් අතර රු. 30,000,000 ක වෙනසක් පැවතුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ.අතපසු වීමක් හේතුවෙන් පුනරාවර්තන වියදමක් වන 1501 සුභ සාධන වියදම ACA2ආකෘතියෙහි ප්‍රාග්ධන වියදමට ඇතුලත්ව ඇති අතර එය නැවත සිදු නොවීමට වග බලා ගන්නා බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු. 104,271,049 ක් වුවද, සිගාස් වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව අනුව එම අගය රු. 75,943,679 ක් විය. ඒ අනුව ගිණුම හා වාර්තාව අතර රු. 28,327,370 ක වෙනසක් පැවතුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ.2021 වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් සියල්ල සිගාස් වෙබ් යෙදුමේ දෝෂයක් හේතුවෙන් Web upload කිරීමට නොහැකි විය. Web upload නොකරන ලද වත්කම් සියල්ල 2022 වර්ෂයේදී Web upload කිරීමට කටයුතු කරන බව. | - එම - |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 447 ප්‍රකාර දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය නිසි පරිදි පවත්වා නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදිව වැය ලෙජරය පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝර්මය අනුව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිවිධාන ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 02 ක් යටතේ සලසා තිබූ රු.1,900,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වන බව. | වියදම් නිසි පරිදි කළමනාකරණය කළ යුතු වීම. |
| (ආ) | වැය විෂයයන් 06 ක රු.21,100,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.8,991,517 ක් ඉතිරි වී තිබුණු අතර එය සියයට 31 සිට සියයට 99 දක්වා පරාසයක විය. | COVID – 19 හේතුවෙන් සැලසුම් කල පරිදි කටයුතු සිදු නොවීම හේතුවෙන් වියදම් අඩුවීම නිසා ප්‍රතිපාදන ඉතිරිවූ බව. | -එම- |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ 2021 වර්ෂයට අදාළව රු. 4,976,047 ක් ගෙවීම් කර ඇතත් මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) හි බැරකම් යටතේ මෙම වියදම් දක්වා නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. 2021 වර්ෂයේ ප්‍රතිපාදන නොතිබීම හේතුවෙන් 2022 වර්ෂයේදී, 2021 වර්ෂයට අදාලව දරන ලද වියදම් බැරකම් යටතේ දැක්වීමට නොහැකි වූ බව. | බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතු වීම. |

**2.3** අධිවැය

--------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 422-2-3-3-1001 වැය විෂයයේ ප්‍රතිපාදනය රු. 3,280,318,000 ක් වූ අතර වියදම රු. 3,354,673,089 ක් වූයෙන් අධිවැය රු. 74,355,089 ක් විය.මේ හේතුවෙන් 422-2 වැඩසටහනෙහි හා 422-2-3 ව්‍යාපෘතියේ රු.37,339,867 ක අධිවැයක් හා 422 වැය ශීර්ෂයේ රු.18,340,002 ක අධිවැයක් ඇතිවී තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මු.රෙ.208 යටතේ ප්‍රතිපාදන ඉල්ලා ලිපියක් යවන ලදී.මහා භාණ්ඩාගාරයේ විවිධ ගිණුම ඒ වන විට ශුන්‍ය කර ඇති බැවින් ප්‍රතිපාදන ලබා දීමට නොහැකි තත්ත්වයක් උද්ගත විය.ඒ අනුව 2021 වර්ෂයට අදාලව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවීමක් සිදු වී ඇති බව. | ඇස්තමේන්තු ප්‍රතිපාදනය තුළ වියදම් කළමනාකරණය කර ගත යුතු වීම. |

**2.4** සීමා ඉක්මවීම්

----------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් කාර්යයන් සඳහා විසර්ජන පනතින් බලය දෙනු ලැබූ වියදම් උපරිම සීමාව රු. 8,000,000 ක් වූ අතර වර්ෂය තුල ප්‍රතිශෝධිත සීමාව රු. 32,000,000 ක් විය. වර්ෂය අවසානයේ තත්‍ය අගය රු. 33,401,679 ක් වූ අතර වියදම් උපරිම සීමාව ඉක්මවීම රු. 1,401,679 ක් විය. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වන බව. | විසර්ජන පනතේ සීමාවන් පිළිපැදීමට කටයුතු කළ යුතු වීම. |

2.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2) | 642,930 | අවස්ථා 5 කදී රු. 100,000 ඉක්මවා අත්තිකාරම් නිකුත් කර තිබුණු අතර ඉන් අත්තිකාරම් 02 ක් දින 19 ක් හා දින 28 ක් ප්‍රමාද වී පියවා තිබුණි. | මින් ඉදිරියට රු.100,000 ඉක්මවා අත්තිකාරම් ලබා නොදීමට සහ සති 02 ක් ඇතුළත අත්තිකාරම් පියවීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii) මුදල් රෙගුලාසි 751 | 1,315,070 | බඩු ලේඛන පොත්වල උපකරණ සටහන් කර නොතිබුණි. | රටේ තත්ත්වය සාමකාමී වූ විට පිරිවෙන්වලට ලබා දුන් භාණ්ඩවලට අදාල රිසිට්පත් සම්පූර්ණ කරගැනීමට කටයුතු කරන බව. | අමාත්‍යාංශයට ලැබෙන සියළු භාණ්ඩ මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොතෙහි සටහන් කළ යුතු වීම. |
| | (iii) මුදල් රෙගුලාසි 756 (6) | - | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් විධිමත්ව පත්කර ඇති අතර මේ වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.3 ඡේදය | 1,315,070 | භාණ්ඩ මිලදී ගැනීම් සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු 03ක් සඳහා තාක්ෂණික දැනුම ඇති පුද්ගලයින් පත්කර නොතිබුණි. | මිලදී ගැනීමේදී තාක්ෂණික කමිටුවට විෂය විශේෂඥයෙකු පත් කිරීමට අපහසු විය. නමුත් ඉදිරි මිලදී ගැනීම සඳහා විෂය විශේෂඥයෙකු ඇතුළුව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.4 ඡේදය | 321,154 | ස්ථාන මාරු ලැබූ නිලධාරීන්ගේ ණය ශේෂ මාසික ගිණුම් සාරාංශ හරහා පියවීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව පිරිවෙන් ගොඩනැගිලි අළුත්වැඩියා සිදුකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 100 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබූ නමුත් සංවර්ධනය කළ යුතු පිරිවෙන් තෝරාගැනීමට නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වන බව. | සංවර්ධනය කළ යුතු පිරිවෙන් තෝරාගැනීමට නිසි ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) නියැදි පරීක්ෂාවේදී මොණරාගල දිස්ත්‍රික්කයේ පිරිවෙන් 18 ක ගොඩනැගිලි සංවර්ධනය සඳහා රු. මිලියන 24.38 ක් වෙන්කර තිබුණද පිරිවෙන් 10 ක් සඳහා රු. මිලියන 13.88 ක ප්‍රතිපාදන පමණක් ලබා දී තිබුණි. එම මුදලින් රු. මිලියන 2.98 ක් වියදම් කර තිබුණු අතර තවදුරටත් ගෙවිය යුතු මුදල රු. මිලියන 10.28 ක් විය. | -එම- | ප්‍රතිපාදන උපරිමයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) දහම් පාසල් 22 ක් සඳහා ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු. මිලියන 11.03 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඒවාට අදාළ ප්‍රගති වාර්තා අමාත්‍යාංශය විසින් ලබාගෙන නොතිබුණි. ප්‍රතිපාදන ලබා දී ඇතත් අදාල කාර්යයන් නිසි පරිදි සිදු වන්නේද යන්න සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විධිමත් අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් හෝ සිදු කර නොතිබුණි. | අප වෙත ලැබී ඇති ඉල්ලීම් සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රතිපාදන වෙන් කරන ලදි. සියලු දිස්ත්‍රික් වල ප්‍රගති වාර්තා අප වෙත පෙබරවාරි මස දෙවන සතියේදී ලැබී ඇති බව. | ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයක් පැවතිය යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් මාසයේ ඇණවුම් කරන ලද රු. 62,412,298 ක් වටිනා උපකරණ සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන ඇණවුම් ප්‍රදාන ලිපියේ (letter of awarding) සඳහන් කොන්දේසි පරිදි අදාළ දිනයන්හි තම ප්‍රසම්පාදන කටයුත්ත අවසන් කළ යුතු වුවද රු. 50,467,889 ක භාණ්ඩ බෙදා හැරීමට 2022 පෙබරවාර් 10 දින වන විට දින 42 සිට 173 අතර කාලයක් ප්‍රමාද වී තිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. 2022 වර්ෂයේ නියමිත පරිදි බෙදාහැරීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන ඇණවුම් ප්‍රදාන ලිපියේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) දුෂ්කර, අතිදුෂ්කර හා හුදෙකලා ලෙස හඳුනාගත් පළාත් හි පිරිවෙන්වල, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට හා සීල මාතාවන්ටද, ශිෂ්‍ය ශිෂ්‍යාවන් හටද පාවහන් ලබාදීමේ වැඩසටහන යටතේ පළාත් 06 ක දිස්ත්‍රික්ක 12 ක් තුළ සිසුන් 22,277 ක් සඳහා පාවහන් තිළිණපත් ලබාදීම සඳහා රු. මිලියන 30 ක මුදලක් වැය කර තිබුණද එම පාවහන් තිළිණපත් බෙදාදීම සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණු අතර තිළිණපත් බෙදා හැරීම පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | පාවහන් තිළිණපත් ඒ ඒ පළාත් වල අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) මගින් අදාල පිරිවෙන් වල පරිවේනාධිපති හරහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට හා සීල මාතාවන්ට ද ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට ලබා දී ඇත. තිළිණපත් ලබා දුන් ආකාරය පිළිබඳ ලේඛණයක් මේ සමඟ ඉදිරිපත් කරන බව. | පාවහන් තිළිණපත් ලබාගත් බවට තහවුරු කිරීමේ ලේඛන විධිමත් පරිදි පවත්වාගත යුතු වීම. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් රාජ්‍ය අමාත්‍යාංශයට රු. 3,728,063 ක් ලබාදී තිබුණු අතර මෙම මුදල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පුහුණු කටයුතු සඳහා ගෙවා ඇතත් මෙම කාර්යය ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.තවද මෙම ගෙවීම සඳහා කුවිතාන්සියක්ද ලබාගෙන නොතිබුණි. | අදාල පුහුණු කටයුතු සිදුකිරීමට නොහැකි වූ අතර මේ වන විට පුහුණු කටයුතු ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇති බව. | පුහුණු සැලසුමක් පිළියෙල කිරීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණකයකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. අභ්‍යන්තර විගණනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහය ලබා ගැනිමට කටයුතු කරමින් සිටින බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. අභ්‍යන්තර විගණනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහය ලැබුණු වහාම විගණන හා කළමනාකරණ කමිටු පත් කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අනුමත රියදුරු තනතුරු සංඛ්‍යාව 07 ක් වුවද තථ්‍ය රියදුරු සංඛ්‍යාව 11 ක් වීමෙන් අතිරික්තය 04 ක් විය. එසේම අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරු හතරක තථ්‍ය සේවක සංඛ්‍යාව 09 ක් විය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු බව. | මානව සම්පත් නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |